නාඋල ප්‍රාදේශීය සභාව
මාතලේ දිස්ත්‍රික්කය

1. මූල්‍ය ප්‍රකාශන
-----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
------------------------------

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 29 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 ජූනි 28 දින සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය
-----------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2017 දෙසැම්බර් 31 දිනට නාඋල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
---------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
---------------------------

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට පැවති ආයුර්වේද ඖෂධ තොගය සමීක්ෂණය කර ගිණුම් ගතකර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ වැඩසටහන යටතේ ලද රු.7,105,131 ක ප්‍රාග්ධන ආධාර, පුනරාවර්තන ආධාර ලෙස ගිණුම් ගතකර තිබීමෙන් ප්‍රාග්ධන ආදායම් එම ප්‍රමාණයට අඩුවෙන් හා පුනරාවර්තන ආදායම එම ප්‍රමාණයට වැඩියෙන් දැක්වුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් මාසයේ ස්ථාවර තැන්පතු පොළී ආදායම වූ රු.48,016 ක් ගිණුම්ගත කර නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය තුළ මිලදීගෙන තිබූ අල්මාරි 6 ක, මුද්‍රණ යන්ත්‍රයක සහ සෙවිලි තහඩුවල එකතු වටිනාකම වූ රු.214,980 ක් පුනරාවර්තන වැය යටතේ ගිණුම්ගත කර තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂය තුළ නාඋල මහජන වැසිකිළි වල වූෂණය කිරීම සඳහා වැයකල රු.35,514 ක් ප්‍රාග්ධන වැය යටතේ ගිණුම්ගත කර තිබීමෙන් ප්‍රාග්ධන වැය සමාන වටිනාකමින් වැඩියෙන් දැක්වුණි.

(ඊ) අරමුදල් ප්‍රතිපූර්ණය වීමට නොමැති කර්මාන්තයක වටිනාකම ණයගැතියෝ යටතේ දැක්වීමෙන් ණයගැති ශේෂය රු.980,000 කින් වැඩියෙන් දැක්වුණි.

(උ) භෞතිකව පැවැත්මක් නොමැති ගොඩනැගිලි 2 ක වටිනාකම ගිණුම්වල ඇතුළත් කිරීම හේතුවෙන් රු.186,500 කින් ඉඩම් හා ගොඩනැගිලි ශේෂය වැඩියෙන් දැක්වුණි.

1.3.2 නොසැසඳුණු ගිණුම්
---------------------

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු.187,195,266 ක් වූ ගිණුම් විෂයන් 8 කට අදාළ ශේෂයන් සහ ඒවාට අදාළ උපයෝගී ලේඛන හා වාර්තාවල දැක්වෙන ශේෂයන් අතර වෙනස්කම් දක්නට ලැබුණු අතර, නිරීක්ෂණය වූ අසමානතාවල එකතුව රු.5,814,427ක් විය.

1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

-----------------------------------

(අ) ලැබිය යුතු ගිණුම්

-------------------

සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට ලැබිය යුතු ගිණුම් ශේෂ 7 ක වටිනාකම රු.17,959,206 ක් වූ අතර ඉදිරිපත් කරන ලද කාල විශ්ලේෂණයට අනුව වර්ෂ 3 කට වැඩි කාලයක් තිස්සේ නිරවුල් නොකර පවතින රු.2,687,966 ක ශේෂ ඊට ඇතුළත් වී තිබුණි.

(ආ) ගෙවිය යුතු ගිණුම්

-------------------

සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට ගෙවිය යුතු ගිණුම් ශේෂ 2 ක වටිනාකම රු.11,528,848 ක් වූ අතර ඉදිරිපත් කරන ලද කාල විශ්ලේෂණයට අනුව වර්ෂ 3 කට වැඩි කාලයක් තිස්සේ නිරවුල් නොකර පවතින රු. 2,483,577 ක ශේෂ ඊට ඇතුළත් වී තිබුණි.

1.3.4 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැති වීම

--------------------------------------------------------

තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම

----------------------------------------------

අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.116,504,933 ක් වූ ගිණුම් විෂයයන් 4 ක් විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

1.3.5 අනුකූල නොවීම්

-------------------

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

--------------------------------------------------------------------------

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|
| | රු. | |
| (අ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති මාලාව | | |
| (i) 96 රීතිය | 5,442,861 | ස්ථිර තැන්පතු මුදල් ආයෝජනය කිරීමේදී පී.එස්.35 ආකෘතිය ප්‍රකාරව වවුචරයක් පිළියෙල කර නොතිබුණි. |
| (ii) රීති 217 | - | ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනව පවත්වා නොතිබුණි. |
| (iii) රීති 218 | - | සියලු ඉඩම් හා ගොඩනැගිලි සමීක්ෂණයක් කර නොතිබුණි. |
| (ආ) 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරී පනතේ 22(1) වගන්තිය (1996 අගෝස්තු 06 දිනැති අංක 935/6 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයෙන් සංශෝධිත) | | හෙක්ටයාරයට වැඩි ඉඩම් අනු බෙදීම් කර වෙන්දේසි කිරීමේ අවස්ථා 2 කදී සභාවට පොදු කටයුතු සඳහා පැවරිය යුතු නියමිත ඉඩම් ප්‍රමාණයට වඩා පර්චස් 76 ක් අඩුවෙන් ලබා ගෙන තිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.13,341,726 ක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.12,901,184 ක් විය.

සමාලෝචිත වර්ෂයේ ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ වැඩසටහන යටතේ ලැබී තිබූ ප්‍රාග්ධන ආධාර රු.7,105,131 ක් පුනරාවර්තන ආධාර යටතේ ගිණුම් ගතකිරීම නිසා මෙහෙයුම් ආදායම සමාන වටිනාකමින් වැඩියෙන් දැක්වුණි.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම්

| ආදායම් ප්‍රභවය | | 2017 | | | | 2016 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | ඇස්තමේන් තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන් තුගත ආදායම | බිල් කළ ආදායම | 2016 රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 1,718,000 | 1,655,539 | 1,356,726 | 1,416,942 | 1,729,000 | 1,655,539 | 2,310,814 | 1,096,470 |
| (ii) | කුලී | 2,021,800 | 929,550 | 2,000,582 | 260,195 | 2,029,800 | 936,600 | 1,855,274 | 290,145 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 1,252,500 | - | 1,291,040 | - | 1,016,000 | - | 1,094,700 | - |
| (iv) | වෙනත් ආදායම් | 4,880,000 | 1,734,823 | 5,079,887 | 227,636 | 3,175,500 | 2,234,588 | 6,082,240 | 199,085 |

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

#### 2.2.2 වරිපනම්

(i) සමාලෝචිත වර්ෂය අවසන් දිනට හිඟහිටි වරිපනම් බදු ශේෂය රු.1,416,942 ක් වූ අතර එය වර්ෂයේ බිල් කිරීම වූ රු.1,655,539 කින් සියයට 95 ක අගයක් ගෙන තිබුණි.

(ii) නාඋල නගරයේ ස්ථාන 13 ක වර්ෂ 3 ත් 10 ත් අතර කාලයක සිට පැවත එන හිඟ වරිපනම් ශේෂය රු.128,593 ක් වූ අතර 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) 33 රීතිය ප්‍රකාරව සභාව කටයුතු කර නොතිබුණි.

2.2.3 ජල ගාස්තු

-----------

සමාලෝචිත වර්ෂය අවසානයට හිඟහිටි ජල ගාස්තු ආදායම රු.227,636 ක් විය.

2.2.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු

-------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් නිලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.489,673 ක් හා මුද්දර ගාස්තු රු.3,240,640 ක් විය.

3. මෙහෙයුම් සමාලෝචනය

----------------------------

3.1 කාර්යසාධනය

-----------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභ සාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) ක්‍රියාකාරි සැලැස්ම

--------------------

සමාලෝචිත වර්ෂයේ අයවැය ලේඛනයෙන් රු.3,200,000 ක් ප්‍රතිපාදනය කර ක්‍රියාකාරි සැලැස්මට ඇතුළත් කර තිබූ සංවර්ධන යෝජනා 10 ක් ඉටු නොකර වෙනත් ව්‍යාපෘති 03 ක් වෙනුවෙන් රු.2,950,000ක් වැය කර තිබූ බැවින් ක්‍රියාකාරි සැලසුම් සකස් කිරීමේදී හා ව්‍යාපෘති සැලසුම් කිරීමේදී මහජන අවශ්‍යතා හා වෙනත් තොරතුරු නිවැරදිව හඳුනාගෙන සැලසුම් කර නොමැති බව නිරීක්ෂණය විය.

(ආ) අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

----------------------------------------------

ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ වැඩසටහනින් ලද රු.195,000 ක ප්‍රතිපාදන යටතේ නාඋල සතිපොළේ වාහන නැවතුම් පහසුකම් වැඩිදියුණු කිරීම හා සතිපොළෙන් කපන ලද පස්වලින් නාලන්ද පුස්තකාල භූමිය පිරවීම සඳහා බාහිර ආයතනයකින් බැකෝ යන්ත්‍රයක් කුලියට ලබාගෙන පස් කියුබ් 213 ක් කැපීම සඳහා යන්ත්‍ර පැය 27.5 ක් වෙනුවෙන් රු.178,750 ක් ගෙවා තිබුණි. කපන ලද පස්වලින් කියුබ් 15 ක් පමණක් පුස්තකාල භූමියට ප්‍රවාහනය කර තිබූ අතර අපේක්ෂිත පරිදි පුස්තකාල භූමියේ ආරක්ෂිත බැම්ම ඉදි නොකිරීම හේතුවෙන් කපන ලද පස් කියුබ් 198 ක් සතිපොළ භූමිය තුළම තිබූ බව 2018 පෙබරවාරි 23 දින සිදුකල ස්ථානීය පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.

(ඇ) ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය

---------------------------------

සභා බල ප්‍රදේශයේ දිනකට එකතු වන කසළ මෙට්‍රික් ටොන් 1½ ත් 2 ත් අතර ප්‍රමාණයක් සේරුදණ්ඩාපොල ඉඩමට බැහැර කර තිබුණි. දිරන හා නොදිරන ලෙස කසළ වෙන්කර තිබුණද දිරන කසළවලින් පොහොර නිෂ්පාදනය නොකරන අතර නොදිරන කසළ සඳහා පිළිස්සීමේ ක්‍රමවේදයක් අනුගමනය කර තිබුණි. අක්කර 2 යි රූඩ් 3 ක අදාළ ඉඩම පවරා ගැනීමට 2013 වර්ෂයේ සිට නොහැකි වී තිබුණි.

(ඇ) තිරසර සංවර්ධන ඉලක්ක

----------------------------

තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය - 2030 යටතේ සභාව මඟින් යහපත් සෞඛ්‍ය පරිසරයක් හා යටතල පහසුකම් වැඩිදියුණු කිරීම යන අරමුණු යටතේ නිරෝගිමත් සමාජයක් හා දරිද්‍රතාවය සහ අසමානතාව අවම කිරීම යන තිරසාර සංවර්ධන ඉලක්ක හඳුනාගෙන තිබූ නමුත් ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් නොවීම, සම්පත් අවම වීම හා ප්‍රමාණවත් පුහුණුවක් නොවීම යන ගැටළු හේතුවෙන් එකී ඉලක්ක ළඟාකර ගැනීම ගැටළු සහගත තත්ත්වයක පැවතුණි.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

---------------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) වරිපනම් සඳහා පවත්වාගෙන යනු ලබන පරිගණක මෘදුකාංගය මඟින් ලබාගන්නා ශේෂ වාර්තා සහ වරිපනම් ලේඛන අතර, නොසැසඳීම් පැවති අතර පරිගණක වාර්තා අනුව වූ ශේෂය අවසන් ගිණුම් සැකසීමේදී යොදාගෙන තිබූ නමුත් එම ශේෂයන්හි නිවැරදිතාවයද තහවුරු කරගත නොහැකි තත්ත්වයක පැවතුණි.

(ආ) ප්‍රාදේශීය සභා පනත ප්‍රකාරව වරිපනම් බදු අය නොකලයුතු ස්ථානද 2009 වර්ෂයේ දී තක්සේරුකර වරිපනම් ලේඛනයට ඇතුළත් කර බිල් කිරීම හා අයිතිකරු නිවැරදිව හඳුනා නොගත් වරිපනම් ඒකක සඳහා බිල් කිරීම හේතුවෙන් එම වරිපනම් අයකර ගැනීමේ ගැටළුකාරි තත්ත්වයක් පැවතුණි.

(ඇ) 2014 වර්ෂයේ සිට ණයගැති හා ණයහිමි ශේෂ තුළ වූ අඩක් ඉටුකර නවතා තිබූ සහ තවදුරටත් ඉටු නොකරන කර්මාන්ත 6 ක වටිනාකම වූ රු.1,415,631 ක් සම්බන්ධයෙන් සොයා බලා නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) සභාව සිය බල ප්‍රදේශයේ මහජන සෞඛ්‍ය ප්‍රරෝහණය කිරීමේ හා ආරක්ෂා කිරීමේ පොදු පරිපාලන අධිකාරිය ලෙස කටයුතු කළ යුතු වුවත් සභා බල ප්‍රදේශය තුළ සභාව මඟින් නඩත්තු කරන ජල යෝජනා ක්‍රම 3 ක ජල යෝග්‍යතාවය පරීක්ෂා කර නොතිබුණි. තවද ප්‍රජා මූල සංවිධාන මඟින් පාලනය වන ජල ව්‍යාපෘති 8 කින් බෙදාහරිනු ලබන ජලය සම්බන්ධයෙන් වූ යෝග්‍යතා පරීක්ෂණ වාර්තා අනුව ජලය බීමට නුසුදුසු තත්ත්වයේ පැවති නමුත් පිරිපහදු ක්‍රියාවලියකට යොමු වී එම නුසුදුසු භාවයට පිළියම් යෙදීමට කටයුතු කර නොතිබුණි.

3.3 මානව සම්පත් කළමනාකරණය

--------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) සභාව සතුව පවතින වාහන 9 ක් හා යන්ත්‍ර 2 ක් ධාවනය කිරීමට රියදුරන් දෙදෙනෙක් පමණක් සිටීම හේතුවෙන් ඵලදායීව වාහන යොදවා ගැනීමට නොහැකිවී තිබුණි.

(ආ) අනුමත මාර්ග කම්කරු තනතුරු 7 ක් හා සෞඛ්‍ය කම්කරු තනතුරු 9 ක් තිබූ නමුත් තථ්‍ය මාර්ග කම්කරු සංඛ්‍යාව 6 ක් හා සෞඛ්‍ය කම්කරු සංඛ්‍යාව 4 ක් වීමෙන් හා සිටින මාර්ග කම්කරුවන් 3 දෙනෙකු වෙනත් රාජකාරීවල යොදවා තිබීමෙන් සභාවේ එදිනෙදා රාජකාරී ඉටුකිරීමට නොහැකි තත්වයක් පැවතුණි.

(ඇ) 2014 නොවැම්බර් 12 දිනැති අංක 25/2014 දරන චක්‍රලේඛය ප්‍රකාරව ස්ථිර පත්වීම් ප්‍රදානය කළ සේවකයින් 5 දෙනෙකුගේ පෞද්ගලික ලිපිගොනු යාවත්කාලීන කර ස්ථිර කිරීමට අදාළ කටයුතු සිදුකර නොතිබුණි.

(ඇ) හිටපු ලේකම්වරයෙකුගෙන් 2012 වර්ෂයේ සිට අයනොවී පැවති රු.199,920 ක ණය ශේෂයක් අයකර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි.

3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා
-------------------------------
පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ දෙක තුළ ලැබී තිබුණු ගොඩනැගිලි අයදුම්පත් 175 ක් සඳහා අනුමැතිය ලබාදී තිබුණු නමුත් ඉන් අයදුම්පත් 62 ක් සඳහා පමණක් අනුකූලතා සහතික නිකුත් කර තිබුණි.

(ආ) 1988 මැයි 17 දිනැති අංක 1988/22 දරන පළාත් පාලන දෙපාර්තමේන්තු චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු නොකර 2009 වර්ෂයේ තක්සේරුවම පදනම් කරගෙන සමාලෝචිත වර්ෂයට වරිපනම් බදු අයකර තිබුණි.

(ඇ) මධ්‍යම පළාතේ පළාත් පාලන කොමසාරිස්ගේ 2016 මාර්තු 17 දිනැති අංක 2016/03 දරන චක්‍රලේඛය ප්‍රකාරව තක්සේරුගත කුලියක් අය නොකර 2013 මැයි 30 දිනැති සභා තීරණය පදනම් කරගෙන කඩ 36 කින් රු.2,000 බැගින් කඩකුලී අයකරමින් පැවතුණි.

3.5 වත්කම් කළමනාකරණය
---------------------------

3.5.1 වත්කම්වල ආරක්ෂාව තහවුරු නොකිරීම
-----------------------------------------

(අ) පැවරුම් නියෝග මගින් ලැබී තිබූ ප්‍රාදේශීය සභාව සතු ඉඩම් 4 ක් හා ප්‍රාදේශීය සභාව භාවිත කරනු ලබන තවත් ඉඩම් 5 ක් මිනුම් කර හිමිකම් ලියාපදිංචි කර ගැනීමට කටයුතු කර නොතිබුණු අතර, ප්‍රාදේශීය සභාව සතු සුසාන භූමි 42 ක් හඳුනාගනිමින් මිනුම්ගෙන ඔප්පු සකස් කර නොතිබුණි.

(ආ) අනු බෙදුම්කර වෙන්දේසි කළ ඉඩම්වලින් ප්‍රාදේශීය සභාවට පැවරී තිබූ අක්කර 1 රූඩ් 3 යි පර්චස් 17ක් වූ ඉඩම් කට්ටි 8 ක භූමිය වැට මායිම් යොදා ආරක්ෂා කර ඵලදායී ලෙස පොදු කටයුතු සඳහා යොදා ගැනීමට කටයුතු කර නොතිබුණි.

3.5.2 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්
--------------------------------------
පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) ශක්‍යතා අධ්‍යයනයක් සිදුනොකර මධ්‍යම පළාත් වෙළඳ, වාණිජ හා සංචාරක දෙපාර්තමේන්තු ප්‍රතිපාදන මත රු.2,452,591 ක් වැයකර 2015 වර්ෂය අවසානය වන විට ඉදිකර තිබූ ඓතිහාසික නාලන්දා ගෙඩිගේ ආශ්‍රිත සංචාරක පහසුකම් මධ්‍යස්ථානය සමාලෝචිත වර්ෂය අවසානයට ද විවෘත කරගත නොහැකිව වල්වැදී නිෂ්කාර්යව පැවතුණි.

(ආ) ග්‍රාමීය ජල සම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘතියේ ප්‍රතිපාදන යටතේ රු.3,600,000 ක වියදම් දරා 2008 වර්ෂයේ ඉදිකර තිබූ අළුගොල්ල නිල් දියදහර ප්‍රජා ජල ව්‍යාපෘතියේ ජල පොම්පාගාර සඳහා විදුලි සැපයුම් කටයුතු වර්ෂ 8 ක කාල සීමාව තුළ නිමකර නොතිබූ බැවින් හා දෙවන ප්‍රජා ජල සම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘතිය යටතේ රු.3,600,000 ක වියදම් දරා 2008 වර්ෂයේ ඉදිකර තිබූ සේනාගම ජල උදාර ප්‍රජා ජල ව්‍යාපෘතියේ විනාශ වී තිබූ විදුලි සැපයුම අලුත්වැඩියා කර නොතිබූ බැවින් ව්‍යාපෘති අක්‍රීය තත්වයෙන් නිෂ්කාර්යව පැවතුණි.

3.5.3 වාහන උපයෝජනය
----------------------
පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) අංක PF–7376 දරන කැබ් රථය ධාවනයේ යෙදුනු අවස්ථා 6 කට අදාලව රාජකාරියේ යෙදුනු නිලධාරියා විසින් ශ්‍රී ලංකා සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ අංක 1645 ප්‍රකාරව දෛනික ධාවන සටහන් අත්සන් කර රාජකාරී ගමන්වල නිවැරදිතාවය සනාථ කර නොතිබුණි.

(ආ) 2015 පෙබරවාරි 06 දින පළාත් පාලන ආයතන වල නඩත්තු ඒකක සඳහා අවශ්‍ය මූලික යන්ත්‍ර සූත්‍ර බෙදාදීම වැඩසටහන යටතේ සභාව වෙත ලබාදී තිබූ රු.7,967,144ක් වටිනාකමින් යුතු මාර්ග තලනය 2016 වර්ෂයේ සිට කිසිදු ප්‍රයෝජනයකට නොගෙන පැවතුණි.

3.6 ප්‍රසම්පාදනය
--------------
3.6.1 ප්‍රසම්පාදන සැලැස්ම
-----------------------
රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 අනුව ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් හා සිවිල් වැඩ භාණ්ඩ හා වෙනත් සේවා ඇතුළත් සවිස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබූ අතර, සමාලෝචිත වර්ෂය තුළ රු.2,511,314 ක මිලදී ගැනීම් සිදුකර තිබුණි. මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.2 අනුව ප්‍රසම්පාදන කාල සටහනක්ද පිළියෙල කර නොතිබුණි.

3.6.2 සැපයුම් හා සේවා
---------------------
2017 වර්ෂයේ සිදුකළ මිලදී ගැනීම් පිළිබඳ පහත අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) කැඳවන ලද මිල ගණන් 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 178(7)(2) ප්‍රකාරව ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කර නොතිබුණි.

(ආ) රු. 865,893 ක මිලදී ගැනීම් වලට අදාළ මිල ගණන් ඉදිරිපත් කිරීම් එවනු ලැබූ ලිපි කවරවල 178 (7) (4) හා (5) රීති ප්‍රකාරව දින මුද්‍රා යොදා නොතිබීමෙන් ටෙන්ඩර් කැඳවීමේ අවසාන දිනට පෙර එකී මිල ගණන් ලැබුණේද යන්න තහවුරු නොවුණි.

(ඇ) රු. 291,397 ක්වූ මිලදී ගැනීම් අවස්ථා දෙකකදී ඉදිරිපත් වූ අවම මිලට වඩා වැඩි මිලක් ඉදිරිපත් කළ සැපයුම්කරුවන් තෝරා ගැනීමේදී 178(9)(4) රීතිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ඈ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.6 ප්‍රකාරව ඉතා කෙටි සහ පැහැදිලි පිරිවිතරයන් ඉදිරිපත් කිරීමකින් තොරව අවස්ථා 4 කදී රු. 449,497 ක මිලදී ගැනීම් සිදුකර තිබුණි .

3.6.3 කොන්ත්‍රාත් පරිපාලනය
-----------------------------
කිනිහිරි කන්ද ජල යෝජනා ක්‍රමය
-------------------------------------
පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ 2016 හා 2017 වර්ෂවලදී පිළිවෙලින් ලද රු.1,000,000 ක් හා රු.1,500,000 ක ප්‍රතිපාදන මත යථෝක්ත ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) ව්‍යාපෘතියේ ජල ගබඩා ටැංකිය ඉදිකිරීමට වැඩ විෂයයන් 30 ක් සඳහා ශ්‍රම දායකත්වයද සහිතව රු.1,500,000 කට ඇස්තමේන්තු කර තිබූ නමුත් ව්‍යාපෘතිය ඉටු කිරීමේදී එකී ඇස්තමේන්තුවේ වැඩ විෂයයන්ට අමතරව රු.67,227 ක් වූ නව වැඩ විෂයයන් 4 ක් සඳහා ඇස්තමේන්තු කිරීමත්, වැඩ විෂයයන් 5 ක ඇස්තමේන්තුගත මුදල රු.245,902 කින් වැඩි කිරීමත් ඇස්තමේන්තු කර තිබූ රු.227,461 ක වැඩ විෂයයන් 6 ක් ඉටුකිරීමට අවශ්‍ය නොවීමත් හේතුවෙන් විධිමත් ස්ථානීය පරීක්ෂාවකින් හා අධ්‍යයනයකින් පසුව ඇස්තමේන්තු සකස් කිරීම සිදුකර නොතිබුණි.

(ආ) ජල මූලාශ්‍රය පදනම් කරගෙන සාදා ඇති ළිඳෙහි පතුල කළුගල හා කුඩුගල් මතුවී ඇති බව ස්ථානීය පරීක්ෂාවේදී නිරීක්ෂණය වූ අතර, ළිඳෙහි ජලයේ යෝග්‍යතාවය පිළිබඳව පරීක්ෂා කර වාර්තා ලබාගෙන නොතිබුණි.

4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය
----------------------------------------

4.1 අයවැය පාලනය
------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) ආදායම් විෂයයන් 5 ක සියයට 18 සිට සියයට 78 දක්වා පරාසයක ඉලක්කගත ආදායම් උපයාගැනීමට සමත්වී නොතිබුණි.

(ආ) ආදායම් විෂයයන් 4 ක ආදායම් ඇස්තමේන්තු නොකර රු.11,707,673 ක ආදායම් උපයාගෙන තිබුණි.

(ඇ) වැය විෂයයන් 16 ක ශුද්ධ ප්‍රතිපාදන සහ තථ්‍ය වියදම අතර සියයට 36 සිට සියයට 99 දක්වා පරාසයක විචලනයක් පැවතුණි.

(ඈ) අනුමත අයවැය ලේඛනයේ වැය විෂයයන් 20 ක ප්‍රතිපාදන සීමාවන් ඉක්මවා රු.3,075,984 ක වියදම් දරා තිබුණි.

(ඉ) වැය විෂයයන් 15 ක් සඳහා රු.376,000 ක අයවැය ප්‍රතිපාදන සලසා දී තිබුණද කිසිදු වියදමක් දරා නොතිබුණි.

4.2 විගණන හා කළමනාකරණ කමිටු
------------------------------------

2014 අගෝස්තු 08 දිනැති පළාත් පාලන කොමසාරිස්ගේ අංක සීපීසී/සීඑල්ජී/1/9/1/4 දරන ලිපිය ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටු පවත්වා තිබුණද ආයතනයේ දුර්වලතා මගහරවා ගැනීම සඳහා ඵලදායී අයුරින් එම කමිටු තීරණ උපයෝගී කරගෙන නොමැති අවස්ථා පැවතුණි.

5. පද්ධති හා පාලනය
----------------------

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර සභාවේ අවධානයට යොමුකර ඇති අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළයුතුය .

| | පද්ධතිය | | අඩුපාඩුව |
|---|---|---|---|
| | ----------- | | ----------- |
| (අ) | ආදායම් පරිපාලනය | (i) | ලේඛන නිසි පරිදි නඩත්තු නොකිරීම. |
| | | (ii) | ආදායම් බැංකුගත කිරීමේ ප්‍රමාදය. |
| (ආ) | සේවක කළමනාකරණය | | පුරප්පාඩු සම්පූර්ණකර නොගැනීම |
| (ඇ) | වත්කම් / දේපළ කළමනාකරණය | (i) | ලේඛනගත නොකිරීම |
| | | (ii) | වත්කම්වල නිවැරදි වටිනාකම සනාථ නොවීම. වත්කම් ඌන උපයෝජනය හා නිෂ්ක්‍රීයව පැවතීම. |
| | | (iii) | වත්කම්වල අයිතිය හා ආරක්ෂාව තහවුරු නොකිරීම. |
| | | (iv) | |
| (ඇ) | අයවැය පාලනය | (i) | ප්‍රතිපාදන උපයෝජනය කර නොතිබීම |
| | | (ii) | ආදායම් ඉලක්ක සපුරා නොගැනීම. |